ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී උපාධි පාඨමාලාව - VI වන මට්ටම

අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය I - 2014/2015

දිලික්ත නීතිය - LWU4326

කාලය - පැය එකයි.

---

දිනය - 2015 සැප්තැම්බර් 11 වන දින වේලාව - ප.ව.02.00- ප.ව. 03.00 දක්වා

---

එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත්අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

01. නිමල් සහ මාලා ස්වාමිපුරුෂයා සහ භාර්යාව වේ. සිකුරාදා දින සවස සේවය නිමා කොට නිවසට පැමිණීමෙන් පසුව, මාලා ඇයට තද හිස කැක්කුමක් ඇති බව ප්‍රකාශ කළාය. මිනිත්තු කිපයකට පසුව ඇය වමනය කරන්නට පටන් ගත්තා ය. නිමල් ඇයව ඉතා ඉක්මනින් ආසන්නයේ පැවති පෞද්ගලික රෝහලක් වෙත රැගෙන ගියේය. හදිසි ප්‍රතිකාර ඒකකයේ සිටි වෛද්‍යවරයා මාලාව පරීක්ෂා කොට හැකි ඉක්මනින් ඇයව රෝහල්ගත කරන ලෙස නිමල්ට උපදෙස් ලබා දුන්නේ ය.

මාලා එම රෝහලටම ඇතුළත් කරන ලදී. නමුත්, ඇය වාට්ටුව වෙත රැගෙන යන අවස්ථාවේ වාට්ටුව භාර වෛද්‍යවරයා එහි නොසිටියේ ය. එම අවස්ථාවේ වාට්ටුවේ සේවයේ යෙදී සිටි හෙදිය විශේෂඥ වෛද්‍යවරයකුට දුරකථනයෙන් අමතා උපදෙස් පතන ලදී. විශේෂඥ වෛද්‍යවරයා එම අවස්ථාවේ තමාට රෝහලට පැමිණිය නොහැකි බව ප්‍රකාශ කළේය. ඔහු මාලාගේ වේදනාවට ප්‍රතිකාර ලබා දීමට හෙදියට උපදෙස් ලබා දුන් අතර පසුදින උදෑසන ඇයව පරීක්ෂා කිරීමට පැමිණෙන බව ප්‍රකාශ කළේය. කෙසේ වුව ද පැය කිහිපයකට පසුව මාලාට ආඝාතය වැළඳින. දැන් ඇය ආඝාතයට ලක්ව ඔත්පලව සිටී.

හානි පූරණය කර ගැනීම සඳහා රෝහලට සහ විශේෂඥ වෛද්‍යවරයාට එරෙහිව නඩු පැවරීමට මාලා අපේක්ෂා කරයි.

(i) ඇයට උපදෙස් ලබා දෙන්න. විනිශ්චිත නඩු තීරණ මගින් ඔබේ පිළිතුර තහවුරු කරන්න. (ලකුණු 15)

(ii) මාලාගේ ආඝාත තත්ත්වය ඇයගේ මොළයේ තිබූ ගෙඩියක් නිසා හට ගත්තක් වූයේ නම් ඔබගේ පිළිතුර වෙනස් වන්නේ ද? එය විත්තිකරුවන්ට වාසි සහගත වන්නේ ද? පැහැදිලි කරන්න.

(ලකුණු 05)

02. "දලික්ත නීතියේ නොසැළකිල්ල පිළිබඳ නීති ප්‍රදේශය සළකා බලන විට, විත්තිකරු විසින් බාධා ඇති කරන ලද පැමිණිලිකරුගේ නීතිමය බැඳියාවන් පිළිබඳව රෝම ලන්දේසි නීතිය අවධානය යොමු කරනු ලබයි. අනෙක් අතට, ඉංග්‍රීසි නීතිය අවධානය යොමු කරනු ලබන්නේ විත්තිකරු කෙරෙහි වන අතර ඔහුට/ඇයට සළකා බලන අවස්ථාවේදී පැමිණිලිකරුගේ අයිතිවාසිකම්වලට බාධා නොකිරීම සම්බන්ධයෙන් අවධානයේ යුතුකමක් පවතී ද? යන්නයි."

මෙම ප්‍රවේශයන් දෙක සන්සන්දනය සහ විභේදනය කරන්න. මින් කුමන ප්‍රවේශයක් නොසැළකිල්ල පිළිබඳ සාධාරණ නිශ්චයකට එළැඹීම සඳහා සහාය වන්නේ දැයි ඔබ සිතන්නේ ද? පැහැදිලි කරන්න. ඔබගේ පිළිතුර අදාල නඩු තීරණ මගින් තහවුරු කරන්න.

(ලකුණු 20)

හිමිකම් ඇවිරිණි.

**THE OPEN UNIVERSITY OF SRI LANKA**
**FACULTY OF HUMANITIES AND SOCIAL SCIENCES**
**DEPARTMENT OF LEGAL STUDIES**
**LL.B DEGREE PROGRAMME – LEVEL 6**
**CONTINUOUS ASSESSMENT TEST I– 2014/2015**
**LWU4326 – LAW OF DELICT**
**DURATION: 01 HOUR.**

**DATE: 11th September 2015** **TIME: 2.00 p.m. – 3.00 p.m.**

**Answer one (01) question only**
**Candidates will be penalized for illegible handwriting.**

01. Nimal and Mala are husband and wife. On Friday evening after they came home from work Mala complained that she had a sever headache. After a few minutes she started to vomit. Nimal immediately took Mala to a private hospital which was close by. The Doctor in emergency treatment unit examined Mala and advised Nimal to hospitalize her as soon as possible.

Mala was admitted to the same hospital. But when she was taken to the ward, the doctor in-charge of the ward was not there. The nurse on duty at that time in the ward consulted a consultant by telephone. The Consultant stated that he was unable to come to hospital at that time. He instructed the nurse to give Mala medication for the pain and stated that he would come the following morning to examine her. However, a few hours later Mala had a stroke. She is now paralyzed and bed ridden.

Mala seeks to sue the hospital and the consultant for damages.

a) Advise her. Support your arguments with the help of decided case law.

**(15 marks)**

b) Would your answer be different Mala's stroke was caused by a tumor in her brain? Would this be beneficial to the defendants? Explain.

**(05 marks)**

02. “When considering the area of negligence in the Law of Delict, Roman Dutch Law focuses on the legal interests of the plaintiff that may have been interfered with by the defendant. On the other hand, English Law focuses on the defendant and whether he/she had a duty of care towards the plaintiff not to infringe the rights of the latter in the given situation”.

Compare and contrast these two approaches. Which approach do you think would support a fair determination of negligence? Explain and support your arguments with the help of related case Law.

**(20 marks)**

*-Copyrights reserved-*